සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## තෙවන වාර පරීක්ෂණය - 2020

### 10 - ශ්‍රේණිය

### ව්‍යවසායකත්ව අධ්‍යයනය -I, II

**නම/විභාග අංකය : .........................................................................** **කාලය : පැය 03 යි.**

## I පත්‍රය

**උපදෙස් :**

- **සියලු ම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා, පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ ' X' ලකුණ යොදන්න.**

01. ව්‍යවසායෙකු නිර්මාණශීලීත්වයට බාධාකාරී සාධකයක් වන්නේ,
    1. ගැටලු අභියෝගතා ලෙස දැකීම.
    2. අසාර්ථකත්වය ඉවසීම.
    3. යම් ගැටලුවකට එක් විසඳුමක් පමණක් ඇතැයි සිතීම.
    4. කුතුහලය දිරිමත් කිරීම.

02. ව්‍යවසායකත්වය අර්ථ දැක්වීමේදී වඩාත් වැදගත් ප්‍රකාශය වන්නේ මින් කුමක්ද?
    1. අනාගතය වෙනස් කිරීමට පොළඹවන්නා වූ පුද්ගලයන්ගේ මානසික තත්ත්වයකි.
    2. ඕනෑම ව්‍යාපාරිකයෙකු ව්‍යවසායකයෙකි.
    3. ව්‍යවසායකත්වය දැනුමට පමණක් සීමා වූ සාධකයකි.
    4. ව්‍යවසායකත්වය විශ්වාස හා ආකල්ප කෙරෙහි තදින් ගැලී සිටියි.

03. පොදුවේ අර්ථ දැක්වූ විට ව්‍යාපාරයක් යනු,
    1. භාණ්ඩ හා සේවා සපයනු ලබන නිශ්චිත ස්ථානයකි.
    2. මානව අවශ්‍යතා හා වුවමනා සපුරාලන ඕනෑම ආර්ථික කටයුත්තකි.
    3. මිනිස් අවශ්‍යතා සපුරාලීමට භාණ්ඩ සපයනු ලබන භූගෝලීය ස්ථානයකි.
    4. මිනිස් අවශ්‍යතා සපුරාලීමට සේවා සපයනු ලබන නිශ්චිත ස්ථානයකි.

04. පහත නිෂ්පාදන සාධක අතුරින් ප්‍රාග්ධනයට අයත් වන්නේ,
    1. ඉංජිනේරුවරයාගේ මානසික වෙහෙසයි.
    2. වාරිමාර්ග පද්ධතියයි.
    3. සිංහරාජ වනාන්තරයයි.
    4. පසයි.

05. "ගෙවත්තේ තණකොළ කැපීමේ කුඩා යන්ත්‍ර නිෂ්පාදනය කර අලෙවි කරන ව්‍යාපාරයක් පවත්වාගෙන යන කසුන් ව්‍යාපාර පරිසර සාධක වෙනස් වීම් පිළිබඳව නිරන්තර අවධානයෙන් පසු වන අතර එම වෙනස්කම් තම නිෂ්පාදනය සඳහා යොදා ගැනීමට ද උත්සාහ කරයි." මින් පිළිබිඹු වන කසුන්ගේ ව්‍යවසායකත්ව ගති ලක්ෂණය වන්නේ,
    1. අනාගත දැක්මයි.
    2. නම්‍යශීලීභාවයයි.
    3. ස්වාධීනත්වය.
    4. සුභවාදී වීමයි.

06. ව්‍යවසායෙකුගේ නවෝත්පාදන සඳහා මූලාශ්‍රයක් නොවන්නේ මින් කුමක්ද?
    1. වෙළෙඳපොලේ සිදුවන වෙනස්කම්
    2. පර්යේෂණ හා අත්හදා බැලීම්
    3. ප්‍රජා පරිසරයේ හා ප්‍රජා පරිසරයේ සිදුවන වෙනස්කම්
    4. ගතානුගතික ආකල්ප

07. පුද්ගලයෙකුට නිර්මාණශීලීත්වය වර්ධනය කර ගත හැක්කේ,

1. ගැටලු අභියෝගතා ලෙස දැකීමෙන්ය.
2. විශ්වාස හා ආකල්ප කෙරෙහි ඇලී සිටීමෙන්ය.
3. ක්‍ෂණික ප්‍රතිඵල අපේක්‍ෂා කිරීමෙන්ය.
4. වැරදීම් හා විවේචන සඳහා බිය වීමෙන්ය.

08. මිනිසාගේ අවශ්‍යතාවයක් වන්නේ මින් කුමක්ද?

| | | | |
|---|---|---|---|
| 1. | රජයේ රෝහල් | 2. | ආහාර |
| 3. | බත් | 4. | පෞද්ගලික පාසල් |

09. සේවාවක ලක්‍ෂණයක් වන්නේ,

1. භෞතික පැවැත්මක් සහිත වීමය.
2. පුද්ගලයාගෙන් පුද්ගලයාට සමජාතීය වීමය.
3. සපයන්නාගෙන් වෙන් කළ නොහැකි වීමය.
4. ගබඩාකර පසුව ප්‍රයෝජනයට ගත හැකි වීමය.

10. ව්‍යාපාරවල ගති ලක්‍ෂණයක් වන්නේ,

1. ආර්ථික කටයුත්තක් පැවතීමයි.
2. නිරන්තරයෙන්ම ලාභ ලැබීමයි.
3. සෑම විටම නව්‍යතාවයන් ඉදිරිපත් කිරීමය.
4. නිරන්තරයෙන් තාක්‍ෂණික පරිසරය පිළිබඳව සැලකිල්ල දැක්වීමය.

11. 10 ශ්‍රේණියේ ඉගෙනුම ලබන මදුරු කරදරයෙන් වැළකීමට කුඩා යන්ත්‍රයක් නිෂ්පාදනය කර තිබේ. ඔහු කුමන වර්ගයේ ව්‍යවසායකයෙක්ද?

1. අභ්‍යන්තර ව්‍යවසායකයෙකි.
2. සමාජීය ව්‍යවසායකයෙකි.
3. සාමාන්‍ය ව්‍යවසායකයෙකි.
4. ව්‍යාපාර ව්‍යවසායකයෙකි.

12. ව්‍යවසායකත්වයෙන් දේශීය ආර්ථිකයට හිමිවන ප්‍රතිලාභයක් වන්නේ මින් කුමක්ද?

1. ආකර්ශනීය ලාභයක් ඉපයීම.
2. ප්‍රයෝජනයට නොගත් හැකියාවන් යොදා ගත හැකි වීම.
3. කාර්යයන්හි විවිධත්වයක් ඇති වීම.
4. ප්‍රාදේශීය සංවර්ධනයක් සිදු වීම.

13. ව්‍යවසායකත්වය තුළින් ව්‍යවසායකයාට හිමිවන ප්‍රතිලාභයක් වන්නේ,

1. දේශීය සම්පත් උපයෝජනය කිරීමය.
2. ආදායම් බෙදී යාමේ විෂමතාවය අඩු කිරීම.
3. රටේ සමස්ථ නිෂ්පාදනය ඉහළ යාමයි.
4. කාර්යයන් හි විවිධත්වයක් ඇති වීමයි.

14. බොහෝ විට කුඩා පරිමාණ ව්‍යාපාරයක සීමාකාරී සාධකයක් වන්නේ,

1. ව්‍යාපාරික කටයුතුවලට පවුලේ සාමාජිකයන් මැදිහත් වීම වැඩි වීමයි.
2. නම්‍ය සැලසුම් සකස් කිරීමේ හැකියාවයි.
3. තම උපරිම කැපවීම ව්‍යාපාරයට යෙදිය හැකි වීමය.
4. තම සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගත හැකි වීමයි.

15. කුඩා පරිමාණ ව්‍යාපාරයක් සාර්ථක කර ගැනීමට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ගයක් වන්නේ,

1. ප්‍රවීනයන්ගෙන් අවශ්‍ය උපදෙස් හා මග පෙන්වීම් ලබා ගැනීම.
2. හැකිතාක් පවුලේ සාමාජිකයන් ව්‍යාපාරයට සම්බන්ධ කර ගැනීම.
3. මානව සම්පන්ධතා අවම වශයෙන් පවත්වා ගෙන යාම.
4. තරඟකාරීත්වයට මුහුණ දීම හැකිතාක් මග හැරීම.

16. කුඩා පරිමාණ ව්‍යවසායකයෙකු වූ පැතුම් සම්පත් ප්‍රදේශයේ ප්‍රචලිත ව්‍යාපාරිකයෙකි. අනාගතයේ සිය නිෂ්පාදන රට පුරාම අලෙවි කිරීම සඳහා ව්‍යාපාරය දියුණු කිරීම ඔහුගේ දැක්ම වේ. මින් පිළිබිඹු වන පැතුම්ගේ ව්‍යවසායකත්ව භූමිකාව වන්නේ,

| | | | |
|---|---|---|---|
| 1. | කළමනාකරුගේ භූමිකාව | 2. | අයිතිකරුගේ භූමිකාව |
| 3. | නායකත්ව භූමිකාව | 4. | සාමාන්‍ය ව්‍යාපාරිකයකුගේ භූමිකාව |

17. ව්‍යාපාරය සමස්තයක් ලෙස දකිමින් අනාගත සාර්ථකත්වය සඳහා තීරණ ගෙන දැක්මකින් කටයුතු කිරීම ව්‍යවසායකයෙකුගේ,

| | | | |
|---|---|---|---|
| 1. | සන්නිවේදන කුසලතාවයකි. | 2. | මානව කුසලතාවයකි. |
| 3. | සංකල්පනාත්මක කුසලතාවයකි. | 4. | තාක්ෂණික කුසලතාවයකි. |

18. අභ්‍යන්තර පරිසර සාධකයක් නොවන්නේ මින් කුමක්ද?

| | | | |
|---|---|---|---|
| 1. | සම්පත් | 2. | කළමනාකරුවන් |
| 3. | සේවකයන් | 4. | ගනුදෙනුකරුවන් |

19. ප්‍රජා පරිසරය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ කුමක්ද?

1. රජය බදු අනුපාතය ඉහළ දැමීම ව්‍යාපාරවලට තර්ජනයකි.
2. ළමා ජනගහනය වැඩි වීම ළමා උද්‍යාන නිර්මාණකරුවන්ට අවස්ථාවකි.
3. අන්තර් ජාතික වෙළෙඳපොළට ඉඩ ප්‍රස්ථා ලැබීම ව්‍යාපාරිකයන්ට අවස්ථාවකි.
4. බැංකු ණය පොළී අනුපාත ඉහළ යාම ව්‍යාපාරවලට තර්ජනයකි.

20. නම්‍යශීලී සැලසුමක් ආයතනය තුළ පැවතීම ව්‍යාපාරයට

| | | | |
|---|---|---|---|
| 1. | දුර්වලතාවයකි. | 2. | අවස්ථාවකි. |
| 3. | තර්ජනයකි. | 4. | ශක්තියකි. |

21. "ශ්‍රී ලංකා රජය යටිතල පහසුකම් සංවර්ධනය සඳහා චීනය සමඟ නව ගිවිසුමක් අත්සන් තබයි." මෙය අයත් වන්නේ,

1. ආර්ථික පරිසරය
2. ආසන්න පරිසරය
3. දේශපාලන හා නෛතික පරිසරය
4. විද්‍යාත්මක හා තාක්ෂණික පරිසරය

22. ආර්ථික පරිසරයට අයත් සාධකයක් වන්නේ මින් කුමක්ද?

| | | | |
|---|---|---|---|
| 1. | ආර්ථිකයේ පොදු මිල මට්ටම | 2. | ජන සංයුතිය |
| 3. | රාජ්‍ය ප්‍රතිපත්ති හා නීතිරීති | 4. | ජීවන රටාවේ පවතින වෙනස්කම් |

23. දේශීය ව්‍යාපාරයකට තර්ජනයක් විය හැකි සිද්ධියක් වන්නේ,

1. සේවකයන් විවිධ දක්ෂතා හා හැකියාවලින් යුක්ත වීමයි.
2. ව්‍යාපාරය කලානුරූපව වෙනස් නොවී කටයුතු කිරීමයි.
3. ගුණාත්මක අමුද්‍රව්‍ය සාධාරණ මිලකට ලබා ගත හැකි වීමයි.
4. ඉහළ පොළී අනුපාතයකට ණය මුදලක් ලබා ගත හැකි වීම.

24. නව ව්‍යාපාරයකට පිවිසීමට ප්‍රථමයෙන් ව්‍යවසායකයෙකු ප්‍රථමයෙන් කළ යුතු කාර්යයක් වන්නේ,

1. අවශ්‍ය සේවකයන් බඳවා ගැනීමයි.
2. අවශ්‍ය ප්‍රාග්ධන සම්පත් සපයා ගැනීමයි.
3. වෙළෙඳපොළ අධ්‍යයනයක් සිදු කිරීමයි.
4. සුදුසු ව්‍යාපාරික ස්ථානයක් සොයා ගැනීමයි.

25. කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් සමස්ථ ආර්ථිකයම අයහපත් තත්ත්වයට පත් විය. මෙය ව්‍යාපාරයට,

| | | | |
|---|---|---|---|
| 1. | ශක්තියකි. | 2. | අවස්ථාවකි. |
| 3. | තර්ජනයකි. | 4. | දුර්වලතාවයකි. |

26. ශ්‍රී ලංකා ආර්ථිකයේ පවතින ව්‍යාපාර අංශ වර්ගීකරණයට අනුව ද්විතීක අංශයට අයත් කර්මාන්තයක් වන්නේ මින් කුමක්ද?

1. මැණික් කර්මාන්තය
2. නිමවුම් කර්මාන්තය
3. තොග හා සිල්ලර වෙළෙඳාම
4. මිරිදිය ධීවර කර්මාන්තය

27. ව්‍යාපාරයක නව ප්‍රවනතාවයක් නොවන්නේ කුමක්ද?

1. ගෝලීයකරණය
2. පරිසර හිතකාමී බලශක්ති ජනනය
3. සැකසූ ආහාර සඳහා ඉල්ලුම ඉහළ යාම
4. තරඟකාරීත්වය නොසලකා ව්‍යාපාර කටයුතු කිරීම

28. වර්තමාන ශ්‍රී ලංකාවේ පවතින සම්පත්වලින් මතු කර ගත හැකි ව්‍යාපාර අවස්ථාවක් වන්නේ,

1. අභ්‍යවකාශගත කිරීමට සුදුසු යානා නිෂ්පාදනය කිරීමයි.
2. නාවුක කටයුතු සඳහා සුදුසු යාත්‍රා නිෂ්පාදනය කර විකිණීමයි.
3. දේශීය අමුද්‍රව්‍යවලින් අත්කම් නිර්මාණය කර විදේශිකයන්ට විකිණීමයි.
4. ගුවන් ගමන් සඳහා සුදුසු පැරෂුට නිර්මාණය කිරීමයි.

29. උසස් අධ්‍යාපනය අවසන් කළ සපුමල් මාර්ගගත ඉගෙනුම් (Online Teaching) සඳහා ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කරයි. ඒ සඳහා සුදුසුම ව්‍යාපාරික ස්ථානය වන්නේ කුමක්ද?

1. සුවිශේෂී ව්‍යාපාරික ස්ථානයක් අවශ්‍ය නොවේ.
2. පාසල් ආසන්නයේ පිහිටි ගොඩනැගිල්ලකි.
3. මාර්ග පහසුකම් ඇති ජනාකීර්ණ නගරයකි.
4. ප්‍රදර්ශනය සඳහා ඉඩ ඇති ජනාකීර්ණ ස්ථානයකි.

30. නව ව්‍යවසායකයෙකුට වෙළෙඳපොළට පිවිසීමේ දී පවතින භාණ්ඩයක් පවතින වෙළෙඳපොළකට ඉදිරිපත් කිරීමේ අවාසියක් වන්නේ,

1. තරඟකරුවන් රාශියක් සිටීමත් පාරිභෝගිකයින් ඔවුන්ගේ නිෂ්පාදිතවලට නැඹුරුවීමත් වේ.
2. භාණ්ඩය පිළිබඳ පාරිභෝගිකයාට අවබෝධයක් නොමැති වීම.
3. සැලසුම්සහගතව හා උපක්‍රමශීලී ලෙස භාණ්ඩ ඉදිරිපත් කළ නොහැකිය.
4. ආකර්ශණීය ලෙස භාණ්ඩය වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම.

31. ව්‍යවසායකයෙකු හට නිෂ්පාදිතයක් ඉදිරිපත් කිරීමේ S C A M P E R ආකෘතියට අනුව යලි සකස් කිරීම (Rearrange) යනු,

1. භාවිත යෙදවුම් වෙනුවට වෙනත් දෑ යොදා ගැනීමයි.
2. කුඩා නිෂ්පාදිත උපාංග විශාල කිරීමයි.
3. නිෂ්පාදිතවල ඇතැම් කොටස් ඉවත් කිරීම.
4. නිෂ්පාදිතවල පිළිවෙළෙහි හෝ උපාංගවල වෙනසක් සිදු කිරීම.

32. වර්තමානයේ ජංගම දුරකථනය මඟින් ඇමතුම් ලබා ගැනීම පමණක් නොව කැමරා, මාර්ගගත සිතියම්, අන්තර්ජාල පහසුකම් ආදිය ද ලබා ගත හැකිය. S C A M P E R ආකෘතියට අනුව මෙය අයත් වන්නේ,

1. ආදේශ කිරීමය. (Substitute)
2. සම්බන්ධ කිරීමය. (Combine)
3. විශාල කිරීමය. (Amplify)
4. ඉවත් කිරීමය. (Eliminate)

33. කිරිපිටි වැනි භාණ්ඩ වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමේ දී විවිධ ප්‍රමාණවලින් යුක්ත පැකට් ලෙස ඇසුරුම් කර සපයයි. වෙළෙඳපොළ පිවිසුම් උපාය මාර්ග අතරින් මෙය අයත් වන්නේ,

1. සුවිශේෂී භාණ්ඩයක් ඉදිරිපත් කරන අවස්ථාවයි.
2. නවෝත්පාදන ඉදිරිපත් කිරීමයි.
3. භාණ්ඩ ප්‍රභේදනයෙන් යුක්තව ඉදිරිපත් කිරීමයි.
4. වෙළෙඳපොළ හිඩැස සඳහා භාණ්ඩ ඉදිරිපත් කිරීමයි.

34. වෙළෙඳපොළ හිඩැස සඳහා භාණ්ඩ ඉදිරිපත් කරන අවස්ථාවකට නිදසුනක් වන්නේ,

1. වැඩිහිටියන් සඳහා වෙන් වූ ගුවන් විදුලි නාලිකා
2. බහු උපාංග සහිත පිසින උදුනක්
3. මාර්ගගත ඉගෙනුම් ක්‍රමවේද (Online Teaching) බිහි කිරීම
4. ආහාර ද්‍රව්‍ය සඳහා කුඩා ඇසුරුම් සකස් කිරීම.

35. ඉලක්ක වෙළෙඳපොළ පාරිභෝගිකයන් ආකර්ශනය කර ගැනීම සඳහා වර්තමානයේ යොදා ගත හැකි නවීන තාක්‍ෂණික ක්‍රමවේදයක් වන්නේ,

1. ජංගම රථ මඟින් අලෙවි කිරීම.
2. මුහුණු පොත (Face Book) භාවිතය.
3. අත් පත්‍රිකා බෙදා හැරීම.
4. සමාජ සේවා වැඩසටහන් පවත්වාගෙන යාම.0741201636

36. නව ව්‍යාපාරිකයෙකුට ප්‍රාග්ධනය සම්පාදනය කර ගත හැකි මාර්ගයක් නොවන්නේ මින් කුමක්ද?

1. තම ඉතුරුම් භාවිතා කිරීම.
2. ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ණය මුදලක් ලබා ගැනීම.
3. ගනුදෙනුකරුවන්ගේ අත්තිකාරම් ලබා ගැනීම.
4. කල්බදු පහසුකම් ලබා ගැනීම.

37. හොඳ ව්‍යාපාර අදහසක ලක්‍ෂණයක් වන්නේ,

1. තරගකාරීත්වයට සාර්ථකව මුහුණ දිය හැකි වීමයි.
2. කෙටි කාලීන දැක්මක් සහිතව කටයුතු කළ හැකි වීම.
3. ඉහළ අවධානමක් සහිතව ව්‍යාපාරය කරගෙන යාම.
4. තාක්‍ෂණික වෙනස් වීම් නොසලකා ව්‍යාපාර අදහස් මතු වීම.

38. ව්‍යාපාර අවස්ථා සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ කුමක්ද?

1. ව්‍යාපාර අවස්ථා සුලභ නොවන අතර ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවිය හැකිය.
2. ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවිය නොහැකි අතර විවෘත වේ.
3. ව්‍යාපාර අවශ්‍යතා සුලභ වන අතර ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවිය හැකිය.
4. ව්‍යාපාර අවස්ථා විවෘත සහ සුලභ වේ.

39. යෝග්‍ය ව්‍යාපාර අදහසක් තෝරා ගැනීමේදී සූක්‍ෂම විශ්ලේෂණයේ නිර්ණායකයක් වන්නේ,

1. ව්‍යවසායකයාගේ හැකියා හා ලැදියාවලට ගැලපීමය.
2. දක්‍ෂ සේවක පිරිසක් සිටීමය.
3. නවීන තාක්‍ෂණය දියුණු වීමයි.
4. රජයේ නීතිරීති, ප්‍රතිපත්ති හා දිරිගන්වීම්ය.

40. පහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය වන්නේ මින් කුමක්ද?

1. ව්‍යාපාරිකයා තරගයට ප්‍රතිචාර දැක්වීමට බොහෝ කැමැත්තක් දක්වයි.
2. ගතානුගතික හා සම්ප්‍රදායික ක්‍රමයට ව්‍යාපාර කටයුතුවල නියැළෙන්නා ව්‍යවසායකයා වේ.
3. පරිසර වෙනස්කම් සැලකිල්ලට ගනිමින් නවෝත්පාදන පදනම් කරගෙන කටයුතු කරන්නා ව්‍යවසායකයා වේ.
4. පවතින සම්පත්වලින් වුවද උපරිම ප්‍රයෝජන නොගැනීම ව්‍යවසායකයාගේ ලක්‍ෂණයකි.

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## තෙවන වාර පරීක්ෂණය - 2020

### 10 - ශ්‍රේණිය

### ව්‍යවසායකත්ව අධ්‍යයනය - II

**නම/විභාග අංකය : ..................................................................**

**II පත්‍රය**

උපදෙස් :

- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. ආහාර හා පෝෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් හැදෑරූ සමන් ඖෂධීය කැඳ අලෙවි ව්‍යාපාරයක් ප්‍රදේශයේ ආයුර්වේද රෝහලක් අසළ ආරම්භ කරන ලදි. තම ගෙවත්තේම වගා කරන ලද ඖෂධීය පැළෑටි මේ සඳහා භාවිතා කිරීමත් අලංකාර ලෙස සෞඛ්‍යාරක්ෂිතව අසුරා තැබීමත් නිසා දිනෙන් දින ඖෂධීය කැඳ සඳහා වන ඉල්ලුම ඉහළ යන ලදි. මේ සඳහා පළපුරුද්ද ඇති සේවකයින් දෙදෙනෙකු බඳවා ගෙන තව දුරටත් ගුණාත්වය ඉහළ දමමින් ව්‍යාපාරය දියුණු කිරීම ඔහුගේ අපේක්ෂාවයි. මේ සඳහා කුඩා ව්‍යවසායකයන්ට රජයෙන් අඩු පොළී අනුපාතයට ලබා දෙන රු. 200 000 ක ණය මුදලක් ද ඔහු ලබා ගන්නා ලදි.

ඉහත සිද්ධිය අනුව ( i ) සිට ( x ) දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

i. (අ) සමන්ගේ ව්‍යාපාරය සපුරාලනු ලබන මිනිස් අවශ්‍යතාවය කුමක්ද?
   (ආ) සමන් කුමන වර්ගයේ ව්‍යවසායකයෙක්ද?

ii. (අ) ව්‍යවසායකයෙකු ලෙස සමන් සතු ගති ලක්ෂණ දෙකක් ලියන්න.
   (ආ) සමන්ගේ නිර්මාණශීලීත්වයට බාධාකාරී විය හැකි සාධක දෙකක් ලියන්න.

iii. ව්‍යවසායකයෙකු ලෙස සමන්ට හිමිවන ප්‍රතිලාභ හතරක් ලියන්න.

iv. (අ) ව්‍යවසායකයෙකු ලෙස සමන් දේශීය ආර්ථිකයට දක්වන දායකත්වයන් දෙකක් ලියන්න.
   (ආ) කුඩා පරිමාණ ව්‍යාපාරිකයෙකු ලෙස සමන්ගේ ව්‍යාපාරයේ සීමා දෙකක් ලියන්න.

v. (අ) ව්‍යාපාරය වර්ධනය සඳහා සමන්ට යොදා ගත හැකි මූල්‍ය සම්පාදන මාර්ග දෙකක් ලියන්න.
   (ආ) සමන් ව්‍යාපාරයෙන් ප්‍රමාණවත් ඉපයීමක් ලබා ගත යුත්තේ ඇයි දැයි හේතු දෙකක් දක්වන්න.

vi. සමන්ගේ ව්‍යවසායකත්ව භූමිකා දෙකක් නම් කර එයට නිදසුන් දෙකක් ඡේදයෙන් ගෙන දක්වන්න.

vii. ව්‍යවසායකයෙකුට සාර්ව පරිසරය අධ්‍යයනය කිරීමෙන් ලබා ගත හැකි තොරතුරු මොනවාද?

viii. සමන්ගේ ව්‍යාපාරයට සම්බන්ධ අභ්‍යන්තර හා බාහිර පරිසර සාධක දෙක බැගින් ලියන්න.

ix. (අ) සමන්ගේ ව්‍යාපාරයේ ඉලක්ක ගත පාරිභෝගිකයන් කවුද?
   (ආ) සමන්ගේ ව්‍යාපාරයේ ඖෂධීය කැඳ සඳහා ඉහළ ඉල්ලුමක් ඇති වීමට බලපාන හේතු දෙකක් ලියන්න.

x. සමන්ගේ ව්‍යාපාරයේ දැකිය හැකි ශක්තීන් හා අවස්ථා දෙක බැගින් ලියන්න. **(ලකුණු 2X10=20)**

02. i. ව්‍යවසායකත්වය යනු කුමක්ද?

ii. නිෂ්පාදන සාධක හතර නම් කරන්න.

iii. "ව්‍යවසායකත්වය, රටක සම්පතකි." මීට අදාලව කරුණු හතරක් ඉදිරිපත් කරන්න.

iv. සාර්ථක ව්‍යවසායකයෙකුට නවෝත්පාදන බිහි කල හැකි ආකාර ලියා දක්වන්න.

v. පහත අවස්ථා සඳහා වන ව්‍යවසායකත්ව ගති ලක්ෂණ ලියන්න.

(අ) ගැටලු සහ අවස්ථා දෙස බලා ඒවාට විසඳුම් ලෙස නව අදහස් සංවර්ධනය කිරීමට ඇති ශක්‍යතාව
(ආ) ගැටලුවලට විසඳුම් ලෙස ව්‍යවසායකයෙකුගේ නිර්මාණාත්මක අදහස් අලෙවි කළ හැකි භාණ්ඩයක් බවට පත් කිරීම.
(ඇ) තම අභිමතය පරිදි කටයුතු කිරීමට තීරණ ගැනීමට ව්‍යවසායකයා අපේක්ෂා කිරීම.
(ඈ) පාරිසරික වෙනස් වීම්වලට අනුව අනුගත වීමට ඇති හැකියාව **(ලකුණු 2X5=10)**

03. i. මිනිස් අවශ්‍යතා හා වුවමනාවල වෙනස්කම් දෙකක් ලියන්න.

ii. ව්‍යාපාරවල පවතින ගතිලක්ෂණ හතරක් ලියන්න.

iii. නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (✕) ලකුණ ද යොදන්න.

(අ) සෑම ව්‍යාපාරිකයෙකුම ව්‍යවසායකයෙකු වේ.
(ආ) ව්‍යාපාරිකයා ඉතා ආසන්න ඉලක්ක ඇති කර ගන්නා අතර ව්‍යවසායකයා දිගු කාලීන ඉලක්ක ඇති කර ගනියි.
(ඇ) ආයතන තුළ ඉහළ තනතුරු දරන ව්‍යවසායකත්ව ගුණාංග ඇති පුද්ගලයෝ අභ්‍යන්තර ව්‍යවසායකයන් වෙති.
(ඈ) භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ දී නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා පාරිභෝගිකයා අත්‍යවශ්‍ය වේ.

iv. ව්‍යාපාරිකයා හා ව්‍යවසායකයා අතර පවතින සමානකම් හතරක් ලියන්න.

v. සමාජීය ව්‍යවසායකයා යනු කවරෙක් දැයි හඳුන්වා ඔවුන්ට නිර්මාණශීලීව විසඳිය හැකි සමාජීය ගැටලු දෙකක් ලියන්න. **(ලකුණු 2X5=10)**

04. i. "සාර්ථක ව්‍යවසායකයෙකු වීමෙන් ව්‍යවසායකයාට මෙන්ම දේශීය ආර්ථිකයට ද ප්‍රතිලාභ හිමි වේ." එහිදී ව්‍යවසායකයාට ඇති වන ප්‍රතිලාභ හතරක් ලියන්න.

ii. "කුඩා පරිමාණ ව්‍යාපාර දේශීය ආර්ථික සංවර්ධනයට බොහෝ දායකත්වයන් සපයයි." ඉන් දායකත්වයන් හතරක් ලියන්න.

iii. "බොහෝ කුඩා පරිමාණ ව්‍යාපාර විවිධ හේතු මත අසාර්ථක වනු දැකිය හැකිය." කුඩා පරිමාණ ව්‍යාපාරයක් සාර්ථක කර ගත හැකි ආකාර හතරක් ලියන්න.

iv. "කුඩා පරිමාණ ව්‍යාපාරයක් පවත්වා ගෙන යන සුපුන් ප්‍රදේශයේ ප්‍රසිද්ධ ව්‍යවසායකයෙකි." ඔහු ව්‍යාපාරයෙහි ඉටු කරන කාර්යයන් කිහිපයක් පහත දැක්වේ. ඒ අනුව එහි ව්‍යවසායකත්ව භූමිකාව ලියා දක්වන්න.

(අ) සුපුන් සෑම විටම නිවැරදි හා වැදගත් තීරණ ගනියි.
(ආ) ව්‍යාපාරයේ සම්පත් නිසි පරිදි කළමනාකරණය කිරීමට සෑම විටම උත්සාහ දරයි.
(ඇ) සුපුන් නිරන්තරයෙන් සේවකයන් සමඟ සාකච්ඡා කර ඔවුන් උනන්දු කර වීමට උත්සාහ දරයි.
(ඈ) සුපුන් විසින් සෑම කාර්යයක්ම නිවැරදිව සංවිධානය කොට ක්‍රියාවට නංවයි.

v. ව්‍යවසායකයෙකු සතු පහත මූලික කුසලතා පැහැදිලි කරන්න.

(අ) තාක්ෂණික කුසලතා (ආ) සංකල්පනාත්මක කුසලතා **(ලකුණු 2X5=10)**

05. i. පහත ප්‍රකාශ කියවා එය ව්‍යාපාර ශක්තියක් ද දුර්වලතාවයක් ද යන්න හඳුනා ගන්න.

(අ) ව්‍යාපාර කළමනාකරුවන් ඉතා දක්ෂ සහ පළපුරුද්දක් ඇති අය වීම.
(ආ) ව්‍යාපාර සැලසුම් ක්‍රමවත්ව සකස් නොකිරීම.
(ඇ) ව්‍යාපාර දැක්ම හා මෙහෙවර පිළිබඳ අවබෝධයක් සේවකයන්ට නොතිබීම.
(ඈ) ව්‍යාපාරයේ මූල්‍ය පාලනය වඩාත් කාර්යක්ෂම වීම.

ii. ව්‍යාපාරයක බාහිර පරිසරයට අයත් පරිසර සාධක හතරක් නම් කරන්න.

iii. බාහිර පරිසර සාධකවලින් සිදුවන බලපෑම් පහත දැක්වේ. එම සාධක වලින් මතු කර ගත හැකි ව්‍යාපාර අවස්ථාවක් බැගින් ලියන්න.

(අ) වස විසෙන් තොර කාබනික පොහොර භාවිතයෙන් සාදන නිෂ්පාදන සඳහා වැඩි ඉල්ලුමක් පැවතීම.
(ආ) දිලීර රෝගයක් හේතුවෙන් පොල් එලදාව අඩු වීම නිසා වෙළෙඳපොළ පොල් හිඟයක් ඇති වීම.

iv. ශ්‍රී ලංකාවේ සුලභව පවතින සම්පත් දෙකක් හඳුන්වා ඉන් ආරම්භ කළ හැකි කර්මාන්ත දෙකක් ලියන්න.

v. ව්‍යාපාර පරිසර සාධක සීග්‍රයෙන් වෙනස් වීම නිසා ව්‍යාපාරවල නව ප්‍රවනතා හට ගනියි. මෙම නව ප්‍රවනතා පිළිබඳව සැලකිලිමත් වීමේ වැදගත්කම් හතරක් ලියන්න. **(ලකුණු 2X5=10)**

06. i. පහත භාණ්ඩ සඳහා වන ඉලක්ක ගත පාරිභෝගිකයන් නම් කරන්න.

| | | | |
|---|---|---|---|
| (අ) | පාවහන් | (ආ) | ගමන් මලු |
| (ඇ) | සෙල්ලම් බඩු | (ඈ) | කොම්පෝස්ට් පොහොර |

ii. ව්‍යවසායෙකුට නව භාණ්ඩයක් නව වෙළෙඳපොළකට ඉදිරිපත් කිරීමේ දී ඇතිවන වාසියක් හා අවාසියක් ලියන්න.

iii. S C A M P E R ආකෘතියට අනුව ආදේශ කිරීම (Substitute) සහ යළි සකස් කිරීම (Rearrange) යනු කුමක් දැයි හඳුන්වා ඒවාට නිදසුන බැගින් සපයන්න.

iv. වෙළෙඳපොළ හිඩැසක් යනු කුමක් දැයි පැහැදිළි කරන්න.

v. සුළු පරිමාණ ව්‍යවසායකයෙකුට ප්‍රාග්ධන සම්පාදනය කරගත හැකි මාර්ග හතරක් ලියන්න.
**(ලකුණු 2X5=10)**

07. i. හොඳ ව්‍යාපාර අදහසක ලක්ෂණ හතරක් ලියන්න.

ii. ව්‍යාපාර අදහස් අතරින් යෝග්‍ය ව්‍යාපාර අවස්ථාවක් තෝරා ගැනීමේ ක්‍රියාවලියෙහි ප්‍රධාන පියවර තුන මොනවාද?

iii. පොදුවේ ගත් කළ ව්‍යාපාරයක දැකිය හැකි ශක්තීන් දෙකක් හා දුර්වලතා දෙකක් ලියන්න.

iv. ව්‍යාපාර අදහස් සූක්ෂම විශ්ලේෂණයට භාජනය කිරීම සඳහා සලකා බැලිය යුතු නිර්ණායක හතරක් ලියන්න.

v. ව්‍යවසායෙකුට ලබා ගත හැකි පේටන්ට් බලපත්‍රය (ස්වාධිකාරය) යනු කුමක්ද? එය ලබා ගැනීමෙන් ව්‍යවසායෙකුට ඇතිවන වාසිය කුමක්ද? **(ලකුණු 2X5=10)**

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**තෙවන වාර පරීක්ෂණය - 2020**
**ව්‍යවසායකත්ව අධ්‍යයනය**
**10 ශ්‍රේණිය - පිළිතුරු**

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 01 | **3** | 11 | **2** | 21 | **3** | 31 | **4** |
| 02 | **1** | 12 | **4** | 22 | **1** | 32 | **2** |
| 03 | **2** | 13 | **4** | 23 | **4** | 33 | **3** |
| 04 | **2** | 14 | **1** | 24 | **3** | 34 | **1** |
| 05 | **2** | 15 | **1** | 25 | **3** | 35 | **2** |
| 06 | **4** | 16 | **2** | 26 | **2** | 36 | **2** |
| 07 | **1** | 17 | **3** | 27 | **4** | 37 | **1** |
| 08 | **2** | 18 | **4** | 28 | **3** | 38 | **1** |
| 09 | **3** | 19 | **2** | 29 | **1** | 39 | **4** |
| 10 | **1** | 20 | **4** | 30 | **1** | 40 | **3** |

**I - පත්‍රය**

**(නිවැරදි එක් පිළිතුරකට ලකුණු 01 බැගින් ලකුණු 40 යි.)**

**II - පත්‍රය**

01. i. (අ) ආහාර
(ආ) ව්‍යාපාර ව්‍යවසායකයෙකි

ii. (අ) • අනාගත දැක්ම • අවධානම් භාරගැනීම • සුභවාදී වීම

(ආ) • විශ්වාස හා ආකල්ප කෙරෙහි තදබල ලෙස ගැලී සිටීම.
• ක්ෂණික ප්‍රතිඵල අපේක්ෂා කිරීම.
• වැරදි හා විවේචන සඳහා බිය
ආදී ගැලපෙන පිළිතුරු..........

iii. • කාර්යයන්හි විවිධත්වය • සමාජ සුභසාධනයට දායක වීම
• ආකර්ශණීය ලාභයක් ඉපැයීම • ස්වයංපෝෂිතත බව
ආදී ගැලපෙන පිළිතුරු..........

iv. • ප්‍රාග්ධන සම්පාදන දාර්ග සීමා වීම • නවීන තාක්ෂණය භාවිතා නොවීම
• වෙළෙඳපොළ සීමා වීම • අයිතිකරුගේ දැනුම හා පළපුරුද්දඅඩුවීම

v. (අ) ඉතුරුම්, බැංකු ණය, ස්වකීය වත්කම් යෙදවීම, නෑදෑ හිතමිතුරන්ගෙන්
(ආ) මිලදී ගැනීම් සඳහා ගෙවීම්, බදු ගෙවීම්, වැටුප් ගෙවීම්

vi. • අයිතිකරුගේ භූමිකාව - අවධානම් දැරීම, සම්පත් සැපයීම
• කළමනාකරුගේ භූමිකාව - සැලසුම් කිරීම, ව්‍යාපාර කටයුතු සංවිධානය කිරීම

vii. නිෂ්පාදිත අලෙවි කර ගත හැකිද? අවශ්‍ය සම්පත් පවතීද උදවු උපකාර ලබා ගත හැකිද? අවශ්‍ය අරමුදල් සපයා ගත හැකිද?

viii. • අභ්‍යන්තර - අයිතිකරුවන්, සම්පත්
• බාහිර - පාරිභෝගිකයන්, ප්‍රජාව

ix. (අ) රෝගීන්, රෝහල, අවට ගවසෙන පුද්ගලයන්
(ආ) ආකර්ශණීය ලෙස ඇසිරීම, ගෙවත්තේ පිරිසිදු ඖෂධ භාවිතා කිරීම

x. ශක්තීන් - සමන්ගේ දැනුම, අමුද්‍රව්‍ය ලබා ගැනීමේ පහසුව
දුර්වලතා - ආයුර්වේද රෝහලක් අසල පිහිටා තිබීම, අඩු පොලියට ණය ලබා ගැනීම

**(ලකුණු 2X10=20)**

02. i. ව්‍යවසායකත්වය යනු පරිසරයේ ඇති ව්‍යාපාර අවස්ථා හඳුනාගෙන අවධානම් දරමින් නිර්මාණශීලීත්වය තුළින් නවෝත්පාදන බිහි කිරීමේ යෙදෙන මිනිස් චින්තනය හා සම්බන්ධ වූ ක්‍රියාවලියකි.

ii. භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසායකත්වය

iii. නව සොයා ගැනීම, දිගුවන්, අනුකරණය කිරීම, සංකලනයන්

iv.
- විවිධත්වය ග්‍රහනය කර ගැනීම
- කුතුහලය ඉදිරිපත් කිරීම
- නිර්මාණශීලී බව
- අසාර්ථකත්වය ඉවසීම
- ගැටලු අභියෝග ලෙස දැකීම

v. (අ) නිර්මාණශීලීත්වය (ආ) නවෝත්පාදන
(ඇ) ස්වාධීනත්වය (ඈ) නම්‍යශීලීත්වය **(ලකුණු 2X5=10)**

03. i.

| අවශ්‍යතා | වුවමනා |
|---|---|
| • මූලිකව පැන නගියි | • දෙවනුව පැන නගියි |
| • සීමිතයි | • අසීමිතයි |
| • පොදුයි | • විවිධ වේ |
| • උප්පැත්තියත් සමඟ ඇති වේ | • ව්‍යවසායකයන් හෝ ව්‍යාපාරිකයන් නිර්මාණය කරයි |

ii.
- සම්පත් ගණුදෙනුවල යෙදවීම
- අරමුණක් පැවතීම
- මූල්‍ය ගණුදෙනු සැලකිල්ලට ගැනීම
- ගණුදෙනු අඛණ්ඩව සිදු වීම
- අවධානමක් පැවතීම
- ආර්ථික කටයුත්තක් තිබීම

iii. (අ) අසත්‍යයි (ආ) සත්‍යයි (ඇ) සත්‍යයි (ඈ) අසත්‍යයි

iv.

| ව්‍යාපාරිකයා | ව්‍යවසායකයා |
|---|---|
| • ගතානුගතික හා සාම්ප්‍රදායික ක්‍රමයට ව්‍යාපාර වල යෙදේ. | • නිර්මාණශීලී හා නවෝත්පාදන පදනම් කර ගනියි |
| • අවධානම් භාර ගැනීමට කැමැත්තක් නොදක්වයි. | • තක්සේරු කර දැරිය හැකි අවධානම් භාර ගනියි |
| • තරඟයට කැමැත්තක් නොදක්වයි | • තරඟයට කැමැත්තක් දක්වයි |
| • පවතින සම්පත්වලින් උපරිම ප්‍රයෝජන නොගනියි | • පවතින සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගනියි |

v. සමාජීය ගැටලුවලට නිර්මාණශීලීව විසඳුම් ඉදිරිපත් කරන පුද්ගලයෝ සමාජීය ව්‍යවසායකයෝ වේ.
වසංගත රෝග, කුණු කසල ගැටලුව, මදුරු උවදුර, මත්ද්‍රව්‍ය ගැටලු, පෝෂණ ගැටලු **(ලකුණු 2X5=10)**

04. i.
- ස්වකීය ධෛර්‍යය මත රඳා පැවැත්ම
- සමාජ සුභසාධනය සඳහා දායකවීම
- ස්වයං පෝෂිත වීම
- ප්‍රයෝජනයට නොගත් හැකියා භාවිතය
- කාර්යන්හි විවිධත්වය
- ලාභයක් ඉපයීම
- නිදහස හා ඉහළ තෘප්තිය

ii.
- දේශීය සම්පත් උපයෝජනය
- ප්‍රාදේශීය සංවර්ධනය
- නව භාණ්ඩ හා සේවා වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම
- රැකියා අවස්ථා ජනනය
- සමස්ථ ආර්ථික නිෂ්පාදනය ඉහළ දැමීම
- ආදායම් බෙදීයාමේ විෂමතාව අඩු වීම

iii.
- නිවැරදි සැලසුම් අනුව ක්‍රියාත්මක කිරීම
- ප්‍රවීණයන්ගේ උපදෙස් හා මග පෙන්වීම්
- ගණුදෙනු නිවැරදිව වාර්ථා කිරීම

- බාහිර පරිසර සාධක, හඳුනා ගැනීම හා ප්‍රතිචාර දැක්වීම
- යහපත් මානව සම්බන්ධතා
- ණය, වෙළෙඳපොළ, පර්යේෂණ සඳහා රාජ්‍ය ආයතන සහය ලබා ගැනීම

iv. (අ) අයිතිකරුගේ භූමිකාව (ආ) කළමනාකරුගේ භූමිකාව
(ඇ) නායකයාගේ භූමිකාව (ඈ) කළමනාකරුගේ භූමිකාව

v. (අ) තාක්ෂණික කුසලතා - කිසියම් ආයතනයක හෝ සංවිධානයක කාර්යයන්හි නියැලීමේ දී ඊට අදාල සුවිශේෂ ක්‍රමයක් හෝ තාක්ෂණයක් හෝ භාවිතා කිරීමට ව්‍යවසායකයාට ඇති දැනුම, පළපුරුද්ද හා හැකියාව

(ආ) සංකල්පනාත්මක කුසලතා - ව්‍යාපාරය සමස්ථයක් ලෙස දකිමින් අනාගතයේ දී ව්‍යාපාරික කටයුතු සාර්ථක කර ගැනීමට අවශ්‍ය තීරණ ගැනීම, ඒවා වැඩි දියුණු කිරීම ඒවාට අදාල උපාය මාර්ග සංවර්ධනය කොට ක්‍රියාත්මක කිරීමේ හැකියාව වේ.
**(ලකුණු 2X5=10)**

05. i. (අ) ශක්තියකි (ආ) දුර්වලතාවයකි
(ඇ) දුර්වලතාවයකි (ඈ) ශක්තියකි

ii. ආසන්න පරිසරය, ප්‍රජා පරිසරය, ආර්ථික පරිසරය, දේශපාලන හා නෛතික පරිසරය, තාක්ෂණික පරිසරය, ගෝලීය පරිසරය

iii. (අ) කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය
(ආ) පිටිකල පොල්කිරි නිෂ්පාදනය

iv. මානව සම්පත්, ස්වාභාවික සම්පත්, ඛනිජ සම්පත්, සත්ත්ව සම්පත්

කර්මාන්ත - කෘෂිකාර්මික කටයුතු, සංචාරක කර්මාන්තය, ආයුර්වේද වෛද්‍ය, අත්කම් නිර්මාණ, මැටි කර්මාන්ත, පන් පැදුරු කර්මාන්තය, වේවැල් කර්මාන්තය

v.
- නව ආදායම් මාර්ග සකස් කර ගැනීමේ හැකියාව
- වෙළෙඳපොළ තරගකාරීත්වය ඉහළ යාම
- භාවිතා නොකල සම්පත් භාවිතා කිරීම
- පාරිසරික ගැටලු අවම වීම
- ආවේනික සම්පත් සුරැකීම හා අනාගතයට ඉතිරි කිරීම **(ලකුණු 2X5=10)**

06. i. (අ) පාසල් ළමුන් (ආ) කාන්තාවන්
(ඇ) කුඩා දරුවන් (ඈ) කාබනික නිෂ්පාදනයට යොමු වූ ගොවීන්

ii. වාසිය - තරඟකරුවන් නොමැති වීම
අවාසිය - නව භාණ්ඩ පිළිබඳ දැනීමක් පාරිභෝගිකයන් සතු නොවීම.

iii. ආදේශ කිරීම - භාවිත යෙදවුමක් වෙනුවට වෙනත් දෑ යොදා ගැනීම
යලි සකස් කිරීම - පිළිවෙල හෝ උපාංග හෝ වෙනසක් ඇති කිරීම

iv. වෙළෙඳපොළ පාරිභෝගිකයන්ගෙන් තෘප්තිමත් නොවූ අවශ්‍යතා හා වුවමනා සහිත කොටස

v. ස්වකීය ඉතුරුම්, ස්වකීය වත්කම් යෙදවීම, නෑදෑ හිතමිතුරන්ගෙන්, බැංකු ණය සහ කල්බදු ගණුදෙනුකරුවන්ගෙන් අත්තිකාරම් ලබා ගැනීම **(ලකුණු 2X5=10)**

07. i. ව්‍යාපාරයක් ලෙස සංවර්ධනය කළ හැකි වීම
පරිසරයෙන් මතුවන අවශ්‍යතා සපුරාලිය හැකි වීම
වෙනස්වන අවශ්‍යතා හා වුවමනාවලට ප්‍රතිචාර දැක්වීම
තාක්ෂණය සමඟ ගැලපීම

ii. සාර්ව විශ්ලේෂණය, සූක්ෂම විශ්ලේෂණය, ශදඅත විශ්ලේෂණය

iii.

| ශක්තීන් | දුර්වලතා |
|---|---|
| • සම්පත් පැවතීම | • මූල්‍ය දුෂ්කරතා |
| • දක්ෂ සේවකයන් සිටීම | • යල්පැන ගිය තාක්ෂණය |
| • නිෂ්පාදිතවල ඉහළ ගුණත්වය | • අමුද්‍රව්‍ය හිඟය |
| • මූල්‍ය ස්ථාවරත්වය | • සේවක කැපවීම අඩු වීම |

iv. වෙළෙඳපොළක් පැවතීම
අමුද්‍රව්‍ය සපයා ගැනීම
අවශ්‍ය ප්‍රාග්ධනය සපයා ගැනීම
රාජයේ නීතිරීති, ප්‍රතිපත්ති, දිරි ගැන්වීම්

v. යම් අයෙකුගේ නව සොයා ගැනීමක් වෙනුවෙන් රාජයෙන් ලබා දෙන සහතිකය වේ. නව සොයා ගැනීමේ අයිතය සොයා ගැනීමේ අයිතිය වසර 20 ක කාලයක් තමාට ලබා ගත හැකි වේ. තම අයිතිය යටතේ එය වෙළෙඳපොළට ඉදිරිපත් කළ හැකිය. **(ලකුණු 2X5=10)**